සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

128

අධිකරණ අමාත්‍යාංශය
நீதி அமைச்சு
Ministry of Justice

# දිවුරුම් දුන් භාෂා පරිවර්තකයන් පත්කිරීම සඳහා වන විභාගය - 2023
# Examination for Appointment to the Post of Sworn Translator - 2023

## පරිවර්තනය (සිංහල / ඉංග්‍රීසි)
## Translation (Sinhala / English)

කාලය : පැය 1½ | මුළු ලකුණු : 100
Duration : 1½ hours | Total Marks : 100

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
Answer all questions.

---

- **පහත සඳහන් ජේද ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන්න.**

(01)

(i) යටත් විජිතවාදීන්ගේ පැමිණීමට පෙර, ශ්‍රී ලංකාවේ පැවතියේ රාජාණ්ඩු ක්‍රමයකි. ඉන් අනතුරුව පෘතුගීසි, ලන්දේසි සහ බ්‍රිතාන්‍ය පාලකයන් යටතේ පරිපාලනමය හා රාජ්‍යමය වෙනස්කම් හඳුන්වා දෙන ලදි. මුහුදුබඩ පිහිටි ලන්දේසි පාලනය පැවති ප්‍රදේශ ප්‍රථමයෙන් බ්‍රිතාන්‍ය පාලනයට යටත් වූ අතර, 1815 දී උඩරට රාජධානිය ද බ්‍රිතාන්‍ය පාලනයට යටත් විය. කෝල්බෲක්-කැමරන් කොමිසමේ නිර්දේශවලට අනුකූලව, 1833 දී ශ්‍රීමත් රොබට් හෝටන් නමැති ආණ්ඩුකාරවරයා විසින් විධායක සභාව සහ ව්‍යවස්ථාදායක සභාව නම් වූ යටත් විජිත පාලනය පැවති ශ්‍රී ලංකාවේ ප්‍රථම ව්‍යවස්ථාදායක මණ්ඩල දෙක පිහිටුවන ලදි.

(ලකුණු 10)

(ii) ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය ජනරජයේ උත්තරීතම සහ අවසානාත්මක ලේඛනෝපගත කිරීමේ ජොෂ්ඨ අධිකරණය වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, මෙහි පහත දැක්වෙන ආකාරයේ වූ අධිකරණ බලය ක්‍රියාත්මක කරන්නේ ය. එනම් :-

(අ) පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලත්වය සම්බන්ධයෙන් වූ අධිකරණ බලය;

(ආ) මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ අධිකරණ බලය;

(ඇ) අවසාන අභියාචනාධිකරණ බලය;

(ඈ) උපදේශක අධිකරණ බලය;

(ඉ) ඡන්ද පෙත්සම් සම්බන්ධයෙන් වූ අධිකරණ බලය;

(ඊ) පාර්ලිමේන්තුවේ යම් වරප්‍රසාද කඩකිරීමක් සම්බන්ධයෙන් වූ අධිකරණ බලය; සහ

(උ) පාර්ලිමේන්තුව විසින් නීතියෙන් පවරනු ලබන හෝ නියම කරනු ලබන වෙනත් කාරණා සම්බන්ධයෙන් වූ අධිකරණ බලය.

(ලකුණු 15)

(02)

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 (ඇ) (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, කොමිෂන් සභාවේ හෝ කොමිෂන් සභාව විසින් මෙම පරිච්ඡේදය යටතේ යම් බලයක් පවරා දෙනු ලැබූ යම් කමිටුවක හෝ රජයේ නිලධරයකුගේ හෝ යම් තීරණයක් කෙරෙහි, තමාගේ නීත්‍යානුකූල රාජකාරි කටයුතුවලදී හැර, කෙළින්ම හෝ අන්‍යාකාරයකින්, තමන් විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මගින් හෝ වෙනත් යම් තැනැත්තකු සමග හෝ කවර හෝ ආකාරයකින් බලපෑමක් කරන්නා වූ හෝ බලපෑමක් කිරීමට තැත් කරන්නා වූ හෝ අයුතු ලෙස මැදිහත් වන්නා වූ හෝ කොමිෂන් සභාවේ හෝ කමිටුවක සාමාජිකයකුට එලෙස බලපෑමක් කරන්නා වූ සෑම තැනැත්තෙක් ම වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.

(ලකුණු 20)

(ii) පත්වීම් ලිපියේ සඳහන් වන දිනය හෝ නිලධරයා තනතුරෙහි වැඩ භාර ගන්නා දිනය හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනය පත්වීම ක්‍රියාත්මක වන දිනය වන්නේ ය.

(ලකුණු 05)

- **Translate the following passages into Sinhala**

(03) Normally, whenever we hear anything said we spring spontaneously to an immediate conclusion, namely, that the speaker is referring to what we should be referring to were we speaking the words ourselves. In some cases, this interpretation may be correct; this will prove to be what he has referred to. But in most discussions which attempt greater subtleties than could be handled in a gesture language this will not be so. To suppose otherwise is to neglect our subsidiary gesture languages, whose accuracy within their own limited provinces is far higher than that yet reached by any system of spoken or written symbols, with the exception of the quite special and peculiar case of mathematical, scientific and musical notations. Words, whenever they cannot directly ally themselves with and support themselves upon gestures, are at present a very imperfect means of communication.

**(20 Marks)**

(04)

(i) Whoever forges or counterfeits, or knowingly performs any part of the process of forging or counterfeiting any currency note or bank note shall be punished with imprisonment of either description for a term which may extend to twenty years and shall also be liable to fine.

**(10 Marks)**

(ii) Whoever causes death by doing act with the intention of causing death, or with the intention of causing such bodily injury as is likely to cause death, or with the knowledge that he is likely by such act to cause death, commits the offence of culpable homicide.

**(10 Marks)**

(iii) By virtue of the powers vested in terms of Article 61 B and 58 (1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka, the Public Service Commission enacted these procedural rules on appointment, promotion and transfer of Public Officers and to provide for matters connected therewith and incidental thereto.

**(10 Marks)**